**ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල - 2023**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1999 අගෝස්තු 05 දිනැති ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ භාර ඔප්පුවේ 11 (ඈ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති බැඳුම්කර හා ඇපකර වලින් ලැබිය යුතු ශුද්ධ ආදායම රු. මිලියන 10.34 ක් වුවද කාල විශ්ලේෂණය අනුව මෙම ශේෂය තුල කොන්ත්‍රාත්කරුවන්ගෙන් බැඳුම්කර ආදායම ලෙස වැඩිපුර අයකරගත් රු. මිලියන 1.96 ක බැර ශේෂයක් පවතින බවද නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 වන ඡේදයට පටහැනිව මෙම ණයගැති බැර ශේෂයන් ණයගැති හර ශේෂයන් සමඟ හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පෙන්වාදීම පිළිබඳ ස්තුතිවන්ත වන අතර ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන ඒ අනුව පිළියෙල කිරීමට කටයුතු කරමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය . |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කෙටිකාලීන හා දිගුකාලීන ස්ථාවර තැන්පතු ශේෂය රු. මිලියන 1,635.23 ක් වුවද උපලේඛනය අනුව එම ශේෂය රු. මිලියන 1,635.28 ක් වූ බැවින් රු. මිලියන 0.05 ක වෙනසක් නිරීක්ෂණය විය. | පෙන්වා දීම පිළිබඳ ඔබ හට ස්තුතිවන්ත වන අතර, සඳහන් කර ඇති වෙනස ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමු. | ගිණුම්කරණ දෝෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | 2018 ජුනි 05 දින සිට 2021 සැප්තැම්බර් 28 දින දක්වා ණයගැතියන් විසින් අරමුදලේ බැංකු ගිණුම් 05 ක තැන්පත් කර තිබුණු රු. මිලියන 1.42 ක් වටිනා ණයගැතියන් හඳුනා ගැනීමට නොහැකි වීම නිසා එම මුදල් හඳුනානොගත් බැර ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි. | මෙම හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීම සඳහා දැඩි උත්සාහයක් අප විසින් පසුගිය වසර 3 තුළදී දරා ඇති අතර ඒ අනුව බොහොමයක් තැන්පතු දැනටමත් හඳුනා ගෙන ඇත. | බැංකු ගිණුම් වෙත සෘජුව තැන්පත් කර ඇති මුදල් හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් බිල්පත් වට්ටම් කර කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ මුදලින් සේවායෝජකයින් විසින් බිල්පත් සඳහා මුදල් නොගෙවීම නිසා පියවා ගත නොහැකි වූ මුදල් ශේෂය රු. මිලියන 10.30 ක් විය. එයින් රු. මිලියන 10.21 ක් හෙවත් සියයට 98 ක් එක් කොන්ත්‍රාත් ආයතනකින් ද ඉතිරි සියයට 02 ක් හෙවත් රු. 92,019 ක් වෙනත් ආයතනයකින්ද වසර 04 කට අධික කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | එක් කොන්ත්‍රාත් ආයතනයක් වෙත ලබා දුන් මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා දැනටමත් බේරුම්කරණය වෙත දැනුම් දී ඇත. අනෙක් ආයතනය ලබා ගත් ව්‍යාපෘතිය සාර්ථකව නිම කල හෙයින් කොන්ත්‍රාත්වරයාගෙන් පියවාගත යුතු මුදලක් නොමැති බැවින් එම වියදම ද සමාජ සත්කාරයක් ලෙස සැලකීම අනුමැතියට ගනු ලැබේ. | බිල්පත් වට්ටම් කරදුන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | අරමුදල විසින් කිසිදු සුරැකුමක් තබානොගෙන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ඇපකර නිකුත් කරන අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යයසාධනය අඩුවන අවස්ථාවලදී සේවායෝජකයන් ඇපකර මුදල් අරමුදලෙන් ඉල්ලුම් කරනු ලැබේ. 2011 සිට 2019 වර්ෂය දක්වා අවස්ථා 22 දී එලෙස රු. මිලියන 87.65 ක මුදලක් සේවායෝජකයින් වෙත ගෙවා තිබුණු අතර එයින් රු. මිලියන 4.67 ක් අයකර ගත නොහැකිව 2019 වර්ෂයේදී භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් කපාහැර තිබුණි. තවද 2020 සිට 2022 දක්වා සේවායෝජකයින් වෙත ගෙවා අරමුදලට අයවිය යුතු මුදල රු. මිලියන 30.16 ක් විය. මීට අමතරව 2023 වර්ෂයේ දී රු. මිලියන 26.67 ක් ඇපකර මුදල් කිරීමට අරමුදලට සිදුවී තිබුණි. ඒ අනුව සේවායෝජකයන් වෙත අරමුදල විසින් ගෙවා තිබුණු එකතුව රු. මිලියන 139.80 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට නැවත අරමුදලට අයකර ගත නොහැකිව තිබුණි.<br>මේ සම්බන්ධයෙන් බේරුම්කරණය ඇතුළු නීතිමය ක්‍රියාමාර්ගවල තීන්දු අරමුදලේ වාසියට ලැබී තිබුණද අදාල මුදල් අයකර ගැනීමට නොහැකිව තිබුණු අතර මේ සම්බන්ධ නෛතික කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 0.85 ක් වැය කර තිබුණි. | සේවා යෝජකයන් විසින් කිසියම් හේතූන් මත වාර කීපයකදී ඇපකර මුදල් කිරීමට ඉල්ලා සිටීම තාක්ෂණික ඇගයීමකට ලක් කිරීමෙන් පසු 2023 වසර අවසන් වන විටත් රු. මිලියන 150 ගෙවා ඇත. එම ගෙවීම ප්‍රතිපූර්ණය කිරීමට කොන්ත්‍රාත්වරුන් වෙත දැන්වුවද එසේ නොකළ අවස්ථාවන් හී ඔවුන් ලබා දුන් වගවීමේ ලිපි මත පාඩුව පියවා ගැනීම සඳහා නීති මඟින් කටයුතු කරන ලදී. | කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු අතර අරමුදලට අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ වන ඉදිකිරීම් කර්මාන්ත සිදු කරන කොන්ත්‍රාත්කරුවන් 314 කගේ සහතික කරන ලද බිල්පත්වලට ගෙවීම සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2020 සිට 2023 වසර දක්වා අරමුදල වෙත රු.මිලියන 33,389 ක් ලබාදී තිබුණු අතර එයින් රු. මිලියන 32,782.47 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබුණි. තවද, එම මුදලින් අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර රු. මිලියන 220.62 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් මාර්ගස්ථ මුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙයින් රු. මිලියන 88.10 ක් වසර 01 - 03 ක කාලයක සිටද, රු. මිලියන 3.43 ක් වසර 03- 05 ක කාලයක සිටද රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම රඳවාගත් මුදලින් සම්පූර්ණයෙන් වැඩ නිමවා තිබූ ව්‍යාපෘතීන් 123 කට අදාල රු. මිලියන 60.55 ක මුදල කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහැර අරමුදල රඳවාගෙන තිබුණි. තවද කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැරීම සඳහා වෙනත් විවිධ පාර්ශ්වයන් විසින් අරමුදලට ලබාදී තිබූ මුදල්වලින් 2023 දෙසැම්බර් 31 දිනට අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත පියවා නොතිබුණු මුදල රු. මිලියන 27.77 ක් විය. මෙම ශේෂයෙන් එකතුව රු. මිලියන 7.08 ක් සහ රු. මිලියන 11.89 ක් වූ මුදල් පිළිවෙලින් වසර 01 - 03 අතර සහ වසර 03- 07 අතර කාල පරාසයන් තුළ වූ අතර අදාළ ව්‍යාපෘතිවල වර්තමාන කාර්යසාධනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අරමුදල විසින් රඳවාගෙන තිබුණු බැවින් මෙම මුදල්වල අනාගත පියවීම් සඳහා වන වගකීම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. මෙසේ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් පියවීම සඳහා සේවායෝජකයන් විසින් ලබා දී තිබූ මුදල්, මාර්ගස්ථ මුදල් ලෙස (Transit Money) දීර්ඝ කාල පරාසයන් තුල රඳවා ගැනීම ගැටලු සහගත විය. | මෙම ව්‍යාපෘතිය යටතේ ඇපකර ලබා දීමේදී ආයතනයට ඇතිවන අවදානම අවම කරගැනීමේ අටියෙන් සියලු ගෙවීම් ආයතනය හරහා කරගෙන යනු ලබයි. අවදානම අවම වූ අවස්ථාවන්හී එක් එක් කොන්ත්‍රාත්වරයාගේ එක් එක් ව්‍යාපෘති සමාලෝචනය කර මුදල් නිදහස් කිරීම කරගෙන යනු ලබන අතර ලැබී ඇති මුදලින් 97% කට වැඩි ප්‍රමාණයක මුදලක් මේ වන විටත් නිදහස් කොට ඇත. අවදානම හේතුකොට ව්‍යාපෘති කිහිපයක වගකීම බැහැර වන තෙක් තාවකාලිකව මුදල් රඳවාගෙන ඇත.<br>කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩ අවසන් වූ බවට සහතිකයක් (completion Report ) හෝ අප ආයතනය විසින් ඉදිරිපත් කරන ලද බැඳුම්කරයේ මුල් පිටපත (original Guarantee) අප වෙත නැවත භාර දී නොමැති හෙයින් ද සමස්ථයක් ලෙස ඉහත ව්‍යාපෘති සම්පූර්ණ ගිණුම් පියවීමට සේවායෝජකට මෙතෙක් නොහැකිවී ඇති හෙයින් රඳවා ඇති මුදල් නිදහස් කිරීමට තවත් කාලයක් ගතවනු ඇත. | මේ සම්බන්ධයෙන් පැහැදිලි කොන්දේසි ඇතුළත් කරමින් මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ ගිවිසුම් හෝ අවබෝධතා ගිවිසුමකට (MOU) එළඹිය යුතු අතර රඳවාගත් මුදල් කාලීනව නිරවුල් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවායෝජකයන්ගෙන් ලැබී වසර 05 කට වඩා වැඩි කාලයක් ගතවූ කොන්ත්‍රාත්කරුවන් සඳහා නිදහස් කිරීමට තිබූ රු. මිලියන 5.79 ක ණයහිමි ශේෂයන් විමසුම් කර නිරවුල් කිරීමෙන් තොරව භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් සමාලෝචිත වර්ෂයේදී විවිධ ආදායමට ඇතුළත් කර තිබුණි. | රුපියල් මිලියන 5.8 ආසන්න මුදල භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත විවිධ ආදායම් ගිණුමට එකතු කර ඇත. එලෙසම හඳුනාගත් අවස්ථාවන්හී එම මුදල් අදාල තැන්පත් කරුවන්ට ප්‍රතිපූර්ණය කිරීමට තීරණය කර ඇත. | අදාල ණයහිමියන් දැනුවත් කර නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| | (i) 40(1) ඡේදය | අරමුදලේ සියලුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට ලක් කළ යුතු වුවද සංවිධානය තුළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරයකු ආරම්භයේ සිට මේ දක්වා අරමුදල විසින් පත් කර නොතිබුණි. | අරමුදලේ සියලු ක්‍රියාකාරකම් නිරන්තරයෙන් ඉහළ කළමනාකරණය හා අන්තර් දෙපාර්තමේන්තු කළමණාකරුවන් සහ විශේෂයෙන්ම අභ්‍යන්තර විගණන කමිටුව මඟින්ද සමාලෝචනය කරනු ලබයි. | අරමුදල විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයකට ලක් කල යුතුය. |
| | (ii) 41(1) ඡේදය | අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අඛණ්ඩව සමාලෝචනය කර කාලීනව පාලක මණ්ඩලයට වාර්තා කිරීම සඳහා විගණන හා කළමනාකරන කමිටු පැවැත්විය යුතු වුවත් අරමුදල කිසිදු දිනක විගණන හා කළමනාකරන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. එමෙන්ම මුදල් අමාත්‍යාංශයේ හෝ ඉදිකිරීම් අමාත්‍යාංශයේ හෝ විගණන හා කළමනාකරන කමිටු සඳහාද සහභාගීත්වයක් නොවුණි. | අරමුදලේ අභ්‍යන්තර විගණනය හා වරින් වර ක්ෂණික විගණනය හා සමීක්ෂණය බේරුම්කරු වෙනුවෙන් කටයුතු කරන මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂක ජනරාල් (රාජ්‍ය මුදල් ) මූලිකත්වයෙන් නිරන්තරයෙන් පරීක්ෂා කරන අතර ඇතිවන බොහෝ දෝෂයන් එකෙනෙහිම නිවැරදි කර ගැනීමට උපදෙස් හා අවධානය යොමු කරයි. එහෙයින් වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවයක් මෙතෙක් මතු වී නොමැත. | ජාතික විගණන පනත ප්‍රකාරව විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ආ) | 1999 අගෝස්තු 05 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 9 (ඊ) වගන්තිය | භාරකාර මණ්ඩලයට වැටුප්, දීමනා හෝ ගරු වැටුප් ලබා ගැනීමට අයිතියක් නොමැති නමුත් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී දරන ලද වියදම් ප්‍රතිපූරණය කළ හැකි වේ. නමුත් ඊට පටහැනිව, අරමුදල | අරමුදලේ භාරකරුවන් යනු ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ බේරුම්කරු විසින් නම් කරන ලද විවිධ විශේෂතා ක්ෂේත්‍රවල නිපුණත්වයක් සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයට ඍජුව හා වක්‍රව | අරමුදලේ භාර ඔප්පුවේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විසින් මණ්ඩලයේ වෘත්තීය හැකියාව මත අමතර සේවාවන්හි යෙදීම වශයෙන් රාජකාරි ඉටුකිරීම සඳහා මාසිකව රු.50,000 බැගින් වූ ස්ථාවර මුදලක් ලෙස එකතුව රු. මිලියන 2.5ක්, රු. මිලියන 2.3 ක් හා රු. මිලියන 2.5 ක් පිළිවෙලින් 2021, 2022 සහ 2023 වර්ෂයන් තුලදී ගෙවා තිබුණි. කෙසේ වෙතත්, භාරකාර මණ්ඩලය විසින් රාජකාරි ඉටු කිරීම සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි. මෙම සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන මගින් කිසිදු හෙළිදරව් කිරිමක් සිදු කර නොමැති බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය. | දායකත්වය ලබා දෙන වෘත්තිකයන් වේ. සමස්ථ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය හා අරමුදලෙහි විෂය පථය ඉටු කිරීම හා ගුණාත්මක සේවයක් ඉටු කිරීම සඳහා දායක වේ. මේ සඳහා භාරකරුවන්ගේ කාර්ය සාධනය ඇගයීමෙන් පසු පෙර තක්සේරු කරන ලද මුදලක් මාසිකව ප්‍රතිපූර්ණය කරනු ලබයි. එම මුදල රාජකාරිය ඉටු කිරීමේදී දරණ ලද වියදමක් ලෙස සැලකිය යුතුය. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් නිකුත් කරන ලද මුදල් රෙගුලාසි 876 (3) | කිසියම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු තිබේ නම්, එම අරමුදල පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කළ යුතුය. කෙසේ වෙතත්, අරමුදල 2024 මාර්තු 31 දින වන විටත් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් අරමුදල පිහිටුවා ඇති අතර භාණ්ඩාගාර ලේකම් ආයතනයේ බේරුම්කරු ලෙස අවශ්‍යතාවය මත වැඩිදුර නීතිගත කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කරමු. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 මාර්තු 29 දිනැති චක්‍රලේඛය SEC/2023/E/01 පරිච්ඡේද 07(b) ඡේදය අනුව අරමුදල වර්ෂය තුල ප්‍රසාද දීමනා ලෙස (Lump- Sum payment) රු. මිලියන 2.54 ක් ගෙවා තිබුණු අතර මෙයින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) අඩුකර නොතිබුණි. | පෙන්වාදීම පිළිබඳ ස්තුතිවන්ත වන අතර, 2024 වර්ෂයේ සිට නිවැරදි කිරීමට සටහන් කරගතිමු. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 332.69 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 285.27 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 47.42 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට බැඳුම්කර සහ ඇපකර ආදායම රු.මිලියන 88.90 කින් අඩු වුවද මෙහෙයුම් නොවන ආදායම් රු.මිලියන 169.94 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | විස්තරය | 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය (රු. මිලියන) | 2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය (රු. මිලියන) | වෙනස {වාසිදායක/ (අවාසිදායක)} (රු. මිලියන) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|
| | **ආදායම්** | | | | |
| (අ) | බැඳුම්කර හා ඇපකර ආදායම | 13.45 | 102.36 | (88.91) | (87) |
| (ආ) | ස්ථාවර තැන්පතු පොළී ආදායම | 365.36 | 194.10 | 170.26 | 88 |
| (ඇ) | විවිධ ආදායම් | 5.57 | 0.074 | 5.49 | 7,427 |
| | **වියදම්** | | | | |
| (අ) | ප්‍රවාහන වියදම් | 6.51 | 5.19 | (1.32) | (25) |
| (ආ) | මෙහෙයුම් පිරිවැය | 1.21 | 2.54 | 1.33 | 52 |
| (ඇ) | උපකරණ නඩත්තු පිරිවැය | 0.56 | 0.36 | (0.20) | (56) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයේදී නිකුත් කර තිබුණු බැඳුම්කර සංඛ්‍යාව 74 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එම සංඛ්‍යාව 40 ක් දක්වා අඩු වීම නිසා බැඳුම්කර ආදායම රු. මිලියන 89 න් එනම් සියයට 87 න් පහළ ගොස් තිබුණි.

(ආ) විවිධ ආදායම්හි වර්ධනයට සේවා යෝජකයන්ගෙන් ලැබී වසර 05 කට වඩා වැඩි කාලයක් ගතවූ කොන්ත්‍රාත්කරුවන් සඳහා නිදහස් කිරීමට තිබූ රු. මිලියන 5.79 ක ණයහිමි ශේෂයන් සමාලෝචිත වර්ෂයේදී විවිධ ආදායමට ඇතුළත් කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලැබී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂයට අදාලව අරමුදලේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහතින් දැක්වේ.

| අනුපාතය | 2023 | 2022 |
|---|---|---|
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම අනුපාතය | 5.73 : 1 | 4.29 : 1 |
| **ලාභදායී අනුපාත** | **සියයට** | **සියයට** |
| වත්කම් මත ප්‍රතිලාභ | 11.59 | 10.97 |
| ශුද්ධ ලාභ අනුපාතය | 73.43 | 76.68 |
| හිමිකම් මත ප්‍රතිලාභ | 15.97 | 16.33 |

අරමුදලේ සමාලෝචිත වර්ෂය තුළදී ජංගම අනුපාතය හා වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය වැඩි වී තිබුණු අතර ශුද්ධ ලාභ අනුපාතය, හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කර සංවර්ධනය කිරීම වෙනුවෙන් අරමුදල විසින් 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ රු. මිලියන 2.98 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම පරිදි පළමු වාරිකය සහ සංවර්ධනය කිරීමෙන් පසු ගෙවිය යුතු දෙවන වාරිකයද වශයෙන් එකතුව රු. මිලියන 2.08 ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 70 ක් 2015 සහ 2016 වර්ෂවල දී අදාළ ආයතනය වෙත ගෙවා තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෘදුකාංග සංවර්ධන අත්තිකාරම් මුදල් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.මුදල් ගෙවා වර්ෂ 08 ක් පමණ ගත වුවද 2024 මාර්තු 31 වන දින දක්වාම මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සකස් කිරීම අවසන් කර නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර කාර්යය සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද අරමුදල අපොහොසත්ව තිබුණි. | ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟ ගිවිසුම්ගත වුවද රජයේ ප්‍රතිපත්තිවල වෙනස්වීම මත සාර්ථකව අවසන් කිරීමට නොහැකි වූ බැවින් පසු අවස්ථාවක අභිලාශය ක්‍රියාත්මක කිරීමට විවිධ ආයතන මගින් මිල රු.මි 6.0 සිට රු.මි 60.0 පරාසයකට මිල ගණන් ඉදිරිපත්වීමෙන් පසුව විෂය පථය වෙනස්කර, එය ශ්‍රී ලංකා ටෙලිකොම් සමඟම එකඟ වී දැනට කරගෙන යනු ලබයි. ප්‍රථමයෙන් එකඟ වූ රු.මි 3.0 වටිනාකම තුළ දැනට කරගෙන යමින් පවතී. මේ පිළිබඳව දෙපාර්ශවය 2024 මුල් කාලයේ එකඟතාවය සඳහා අත්සන් තබා ඇත. | කළමනාකරණ තොරතුරු පද්ධතිය ගිවිසුම් ප්‍රකාරව සාර්ථකව සකස් කරවා ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | අරමුදල 1999 දී ආරම්භ කර තිබූ අතර 2000 සිට 2005 දක්වා කාලය තුළ අවස්ථා හතරකදී මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 55 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලබාදී තිබුණි. එහෙත් වාර්ෂික ලාභ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ අතර, 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 949.79 ක් වූ රඳවා ගත් ඉපැයීම්වලින් රු. මිලියන 500 ක් “යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන” නම් සංචිත ගිණුමකට මාරු කර නිෂ්කාර්යව පවතින බවද නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ලාභ හා සංචිත රු. මිලියන 912.95 ක් වූ අතර එදිනට පැවති දිගුකාලීන ආයෝජන රු. මිලියන 1,208.91 ක් ද කෙටිකාලීන ආයෝජන රු.මිලියන 1,041.61 ක් වී තිබුණි. | අනුමත භාර ඔප්පුවේ කොන්දේසි 12(a) යටතේ වත්කම් සියල්ල හෝ කොටසක් ආයතනයේ අරමුණු සඳහා භාවිතා කළ යුතු බවටද බේරුම්කරු විසින් ඉන් පරිබාහිර උපදෙස් ලබා දී නොමැති හෙයින්ද සියලු සංචිතයන් සේවා සීමාවන් වර්ධනය කරගැනීමට භාවිතා කරයි. | චක්‍රලේඛය ප්‍රකාරව උපයන ලද අතිරික්තය හෝ අතිරික්තයේ කොටසක් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඇ) | අරමුදල බැඳුම්කර හා ඇපකර ආදායම (Bond and Guarantee Levy Income) ගණනය කිරීමේ දී කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘති සඳහා බැඳුම්කරයේ වටිනාකමෙන් 2% ක් හා 2.5% ක් | අවධානම යම්තාක් ප්‍රමාණයකට අවම කර ගැනීම සඳහා ගාස්තු විචලනය කිරීමටත් සුරක්ෂණයක් අවශ්‍ය වන්නේනම් ඒ සඳහා කටයුතු | භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් මෙන්ම |

| | | | |
|---|---|---|---|
| | පිළිවෙලින් අත්තිකාරම් බැඳුම්කර (Advance Bond) හා කාර්යය සාධන බැඳුම්කර (Performance Bond) සඳහා අයකර ඇති අතර බැඳුම්කර කාලය දීර්ඝ කිරීමේ දී අයකරන සේවා ගාස්තුව අත්තිකාරම් බැඳුම්කර හා කාර්යය සාධන බැඳුම්කර සඳහා පිළිවෙලින් 1.5% හා 1.75% ක් වුවත් මෙම ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විශේෂ කළමනාකරණ වාර්තා පිටපතක් විගණනයට ඉදිරිපත් කළද භාරකාර මණ්ඩලයේ අනුමැතිය සහිත රැස්වීම් වාර්තා පිටපත් විගණනයට ඉදිරිපත් නොවීය. තවද, බැඳුම්කර හා ඇපකර ආදායමට පවතින අවදානම අනුව යම් මුදලක් අමතරව එකතු කර තිබුණු අතර මෙම අගය කළමනාකරණය විසින් පවතින අවදානම් තක්සේරු කොට බැඳුම්කර හා ඇපකර ආදායමට එකතු කරයි. අවදානම් තක්සේරුව පිළිබඳ කිසිදු ලියවිල්ලක් හෝ සාකච්ඡා සටහන් ලිපිගොනු වල ලේඛන ගත වී නොමැත. මීට අමතරව අරමුදල 2020 සිට 2023 දක්වා වූ වාර්ෂික වාර්තාවන් වල සේවාගාස්තු සම්බන්ධයෙන් සඳහන් පරිච්ඡේදයේ මේ සම්බන්ධව කිසිඳු සටහනක් නොවීය. | කිරීමටත් භාරකාර මණ්ඩලය කළමනාකරණයට සියලු වගකීම් පවරා ඇත. අවදානම යන විෂය පිළිබඳ එක්වරම තක්සේරු කිරීමටත් නොහැකිවීම හේතුකොට ගෙන ආයතනය වෙනුවෙන් වැදගත් වගකීම් කළමනාකරණයට පවරා ඇත. අවදානම අවම කර ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ හෙයින් කමිටුවක් මඟින් අදාල තීරණය ගනු ලබයි. | කළමනාකරණය හෝ කමිටු විසින් ගනු ලබන තීරණ බැඳුම්කර හා ඇපකර ආදායම් ලිපිගොනු වල ඇතුලත් විය යුතුය. |
| (ඇ) | අරමුදලේ පරිගණක ගිණුම් පද්ධතියක් ක්‍රියාත්මක කර නොමැති අතර සියලුම ගණුදෙනු මයික්‍රෝසොෆ්ට් එක්සෙල් පැකේජය (Microsoft excel package) හරහා සිදුකරනු ලැබේ. දෛනිකව ගණුදෙනු විශාල ප්‍රමාණයක් වාර්තා කලයුතු බැවින් ගණුදෙනු වාර්තා කිරීමට විශාල කාලයක් ගතවීම හා ගිණුම්කරණ දෝෂයන් ද ඇතිවීම වැළැක්විය නොහැක. | ආයතනය සතුව ඇත්තේ පෙර සැකසුම් කරන ලද ගිණුම්කරණ පද්ධතියකි (QB). එමඟින් අදාළ ගිණුම්කරණ ලෙජර පෙර සැකසූ ආකෘතියකට අනුව සැකසෙන අතර අපගේ අවශ්‍යතාව සඳහා එම තොරතුරු පැතුරුම් පත් (Excel Sheet) වලට ගොනු ගත කොට අවශ්‍ය පරිදි සැකසිය යුතුවේ. | ගිණුම්කරණය සඳහා යෝග්‍ය පරිගණක පද්ධතියක් යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තිය අනුව, මිල ගණන් කැඳවීම මඟින් වාහන කුලියට ගැනීම සිදු කළ යුතු වුවද වසර 05 කට අධික කාලයක සිට CAC– 6366 අංක දරන වාහනය සඳහා නැවත මිල ගණන් කැඳවීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මසකට රු.265,000 ක (වැට් බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු සහිතව) මිලකට ලබාගෙන තිබුණි. මේ නිසා තරඟකාරී මිල ගණන් කැඳවීම් මඟින් අවම මිල ගණන් යටතේ සේවා ලබාගැනීමේ හැකියාව අහිමි වී තිබුණි. | ආයතනයට රියදුරු සහ ඉන්ධන රහිත වාහනයක් කුලියට ගැනීම සඳහා නිසි ලෙස පුවත්පත් දැන්වීමකින් අනතුරුව ලැබුන මිල ගණන් කාර්මික ඇගයීම් කමිටුවක් මඟින් සමාලෝචනය කර එහි නිර්දේශ භාරකාර මණ්ඩලය මඟින් අනුමත කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි විධිවිධානවලට අනුකූලව තරඟකාරීව සැපයුම්කරුවන් තෝරා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 4.2 පරිච්ඡේදය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කර තිබිය යුතු වුවත් අරමුදල එසේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | මෙම යෝජනාව අගය කරන අතර ආයතනයේ ක්‍රියාකාරකම් පස් අවුරුදු සැලැස්මක් යටතේ කෙරෙන හෙයින් ප්‍රසම්පාදන ක්‍රියාවලියද එයට අනුගතව පිළියෙල කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) 4.2.2. පරිච්ඡේදය අනුව 2023 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම විගණනයට ඉදිරිපත් වුවද එය ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාල සටහනකට අනුව සකස් කර නොතිබුණි. | කාල සටහනක් අනුව 2024 වසරේ ප්‍රසම්පාදන වැඩසටහන පිළියෙල කර දැනට ඒ අනුව කටයුතු කර ගෙන යනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 මගින් නිකුත් කරන ලද 877(2)(ඉ) මුදල් රෙගුලාසියට අනුව, අරමුදලේ ගණන් දීමේ නිලධාරියා විසින් නියමිත විධිවිධාන යටතේ භාෂා තුනෙන්ම වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කළ යුතු අතර එක් එක් මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර ඉහත වාර්තාව සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 මාර්තු 31 දිනය දක්වා අරමුදල විසින් 2020, 2021 සහ 2022 වසර සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | අදාළ වාර්තාව පිළියෙළ කිරීමේදී රජයේ මාර්ගෝපදේශ අනිවාර්යෙන්ම භාවිතා කරන අතර අකෘතියේ පවතින ලෙසම ලේඛන පිළියෙළ නොකරන අතර පරිච්ඡේද 1 සිට 7 දක්වා අවශ්‍ය සියළු තොරතුරු ක්‍රමානුකූලව වාර්තාවට ඇතුළත් කර ඇත. මෙම වාර්තාව සුදුසු කටයුතු සඳහා ආයතනයේ බේරුම්කරු වෙත වර්ෂය අවසන් වූ ප්‍රථම දින 60 තුළ මහා භාණ්ඩාගාරය වෙත යැවීමට නිරන්තරයෙන් කටයුතු කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද 877 (1) (ඇ) මූල්‍ය රෙගුලාසියට අනුව, ඉදිරි වර්ෂය සඳහා භාරකාර මණ්ඩලය විසින් සකස් කරන ලද අයවැය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ සැප්තැම්බර් 30 වන දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය. කෙසේ වෙතත් 2023 වර්ෂය සඳහා අරමුදලේ අයවැය වෙනුවෙන් ඉහත පරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි. | බේරුම්කරු විසින් එහි සියලු බලතල භාරකාර මණ්ඩලයට පූර්ණ වශයෙන් පවරා ඇත. ඒ අනුව භාරකරුවන් වෙත භාර ඔප්පුවේ 7 වෙනි වගන්තිය යටතේ සුදුසු ලෙස පරිපාලනය හා කළමනාකරණය කිරීමට ප්‍රතිපාදන ඇති අතර, භාරකාර මණ්ඩලය විසින් අනුමත අයවැය පිටපතක් අප්‍රමාදව බේරුම්කරු මහා භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කරයි. | රාජ්‍ය මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුයි. |